# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1801/24 - 2013 මාර්තු මස 13 වැනි බදාදා - 2013.03.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

1993 අංක 03, 1995 අංක 07 දරන ප්‍රඥප්ති මගින් සංශෝධිත 1992 අංක 01 දරන බස්නාහිර පළාත් සභාවේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය යටතේ ප්‍රසිද්ධ කරනු ලබන නියෝග

1992 අංක 01 දරන බස්නාහිර පළාත් සභාවේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තියේ 6.6 (ඒ) වැනි වගන්තිය ප්‍රකාරව බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය වෙත පැවරී ඇති බලතල සහ කර්තව්‍ය යටතේ එම අධිකාරිය මගින් සකස් කර 2012.09.24 දින අංක 1777/12 දරන *ගැසට් පත්‍රය* මගින් ප්‍රසිද්ධ කරන ලද නියෝග පහත පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

*නියෝග 1* බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් ධාවනය සඳහා නිකුත් කර ඇති මාර්ග බලපත්‍රවල අයිතිය පැවරීමේ දී දැනට අයකරනු ලබන රු. 100,000.00ක මුදල 2012.12.26 දින සිට 2013.03.25 දින දක්වා රු. 70,000.00ක් ලෙස සංශෝධනය කර අයකරනු ඇත.

*නියෝග 2* 2012 සැප්තැම්බර් මස 24 දින 1777/12 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයෙහි සඳහන් මගී ප්‍රවාහන සේවා නියෝගවල 4 වැනි උපලේඛනයේ අංක 01, 06 හා අංක 15 ගාස්තු පමණක් 2012.12.26 දින සිට 2013.03.25 දින දක්වා පහත සඳහන් පරිදි සංශෝධනය කර අයකරනු ඇත.

| | | |
|---|---|---|
| 01. | මගී සේවා අවසර පත්‍රය සඳහා එක් බස්රථයකට | රු. 3,500.00 |
| 06. | මාසික සේවා ගාස්තුව එක් බස්රථයක් සඳහා (සාමාන්‍ය) | රු. 750.00 |
| 15. | මාසික සේවා ගාස්තුව එක් බස්රථයක් සඳහා (සුඛෝපභෝගී) | රු. 750.00 |

තවද 2012 සැප්තැම්බර් මස 24 දින 1777/12 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද පළාත් සභා නිවේදනයේ ඇතුළත් ගාස්තු 2013.03.26 දින සිට නැවත අයකරනු ඇත.

එච්. එම්. උපාලි කොඩිකාර,
ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා
කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම්
හා බෙදා හැරීම් සහ සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍ය.

2013 මාර්තු මස 13 වැනි දින,
කොළඹ දී ය.

03-1102

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - PG 001581— 360 (2013/03)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.